**ISBN 978-955-4563-72-8**

# "ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය ඔස්සේ ළමා පරපුරට සිදුවන බලපෑම"

**ජී. ඒ . ලසන්ත ශ්‍රේෂන් කුමාර**
**පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය,**
**සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.**

## සංක්ෂේපය

*ළමා පරපුර යනු සොඳුරු ලෝකයක, සංකල්පීය මනෝභාවයන්ගෙන් යුක්ත අතිශය සියුම් ගති පැවතුම් වලින් යුත් කොට්ඨාසයකි. සමාජ ක්‍රියාකාරීත්වය අනුව සිය චර්යාවන් ගොඩනගා ගන්නා ළමයින් සෑම විටම අනුකරණශීලීය. එයට ප්‍රතිවිරුද්ධව යමක් ගොඩනැගෙන්නේ නම් ළමයින් අකාලයේ වැඩිහිටියන් බවට පත් වේ. ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය තුළින් මෙය බොහෝ විට සිදු වන අතර ළමයා තුළ නිෂ්ක්‍රීයව පවතින ප්‍රචණ්ඩත්වය සක්‍රීය කිරීමට ද ළමා මනස මෙහෙයවනු ලබයි. එබැවින් ළමා පරපුර රැකගැනීමටත්, ළමා ආකල්ප අකාලයේ ජනමාධ්‍ය හරහා විනාශ නොකිරීමටත් ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය සැමවිටම හිතකර ලෙස යොදා ගැනීම වර්තමානයෙහි අත්‍යවශ්‍ය සාධකයක් බවට පත් වී ඇත. වර්තමාන ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය නොයෙක් ආකාරයෙන් ළමා පරපුර කෙරෙහි හිතකර මෙන්ම අහිතකර ලෙස ද ප්‍රබල ලෙස බලපාන ආකාරය දක්නට ලැබේ. මෙහිදී ජනමාධ්‍යයෙහි ක්‍රියාකාරීත්ව දිනෙන් දිනම සමාජය තුළ ඉහළ යාමත්, ඒ තුළින් සමස්ත සමාජයෙන් වැදගත් සමාජීය කොටසක් වන ළමා පරපුරට සිදුවන බලපෑම පිළිබඳව අවධානය විශේෂයෙන් යොමු කිරීම හා ගැටලු හඳුනා ගැනීම මෙහි අරමුණ වේ. මෙහිදී ද්වීතියීක මූලාශ්‍ර ඔස්සේ කරුණු අධ්‍යයනය කරනු ලබන අතර, වත්මනෙහි ලංකාවෙහි ක්‍රියාත්මක වන ජනමාධ්‍ය හා එම ජනමාධ්‍ය අංශයන්හි අන්තර්ගත ලක්ෂණ හා ක්‍රියාකාරීත්වයේ ස්වරූපයන් ළමා පරපුර කෙරෙහි සිදුකරන ආකාරය පිළිබඳව මෙහිදී අවධානය යොමු කරනු ලබයි. "ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය ඔස්සේ ළමා පරපුරට සිදුවන බලපෑම" යන උධෘතය ඔස්සේ කරන ලද මෙම අධ්‍යයනයේදී වර්තමාන ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය හා භාවිතය මඟින් යහපත් හා අයහපත් බලපෑම් ප්‍රබල වශයෙන් ළමා පරපුර කෙරෙහි සිදු වන අතරම, අහිතකර ලෙස ජනමාධ්‍ය භාවිතය දිනෙන් දින ඉහළ යන ආකාරය නිගමනය කළ හැකිය.*

*මුඛ්‍ය පද  ජනමාධ්‍ය, ළමා පරපුර, සමාජ බලපෑම, මාධ්‍ය සදාචාරය*

## හැඳින්වීම

ප්‍රාග් ඓතිහාසික මානවයා සිය සන්නිවේදන කාර්යයන් සංඥා, සංකේත හා විවිධ භාෂාත්මක හැකියාවන් ඔස්සේ සිදු කරගන්නා ලදි. එසේ ශත වර්ෂ ගණනාවක් තිස්සේ පරිණාමය වෙමින් පැවත ආ මානව සන්නිවේදන කාර්ය වර්තමානයෙහි අති දියුණු තාක්ෂණික මෙවලම් හා දියුණු භාෂාත්මක, චින්තනමය හැකියාවන් ඔස්සේ සිදු කරනු ලබයි. මෙය මානව පරිකල්පනය තුළින්ම දියුණු වෙමින් පැවත ආ සන්නිවේදන ක්‍රමවේදයන්ගෙන් හා උපාය මාර්ගයන්ගෙන් යුක්තය. වර්තමානය වන විට භාෂාත්මකව, ලේඛනාත්මක හා රූපය පදනම් කොට ගනිමින් ශ්‍රව්‍ය, දෘශ්‍ය මාධය තලයක පිහිටමින් වර්තමාන සන්නිවේදන ක්ෂේත්‍රය ක්‍රියාත්මක වේ.

මානව සංහතියෙහි ආකල්ප, මතවාද, අදහස් සියල්ලම පාහේ සහජයෙන් හා දූනුමෙන් පෝෂිතව නිර්මාණාත්මක පරිකල්පනය විසින් බිහිකරන බව පොදු විශ්වාසයයි. මිනිසා තුළ ගොඩනැගෙන සදාචාරාත්මක හැසිරීම්, විනය, සංස්කෘතික සාධක සියල්ල ආගමික විශ්වාසය, ඇඳහීම් සහ තමන් දරනු ලබන දාර්ශනික මතවාදයන් ඔස්සේ ගොඩනැගෙන්නට විය. එහෙත් වර්තමානය වන විට මුද්‍රිත, විද්‍යුත් හා නව මාධ්‍ය ඔස්සේ ජන මනස පාලනයෙහිලා කරනු ලබන බලපෑම අතිමහත් ය. පුද්ගලයාගේ ආධ්‍යාත්මික හා භෞතික සංවර්ධනය, හැසිරීම් රටාවන් ගොඩනඟනු ලබන්නේ ද ජනමාධ්‍ය හරහා ය. එසේම වර්තමානයෙහි ජන මතය සකස් කරනු ලබන්නේද  ජනමාධ්‍ය හරහා ය. පොදුවේ ගත් කළ වර්තමාන සමාජීය පුද්ගලයා ජනමාධ්‍යට අවශ්‍ය පරිදි ගොඩනැගෙමින් පවතී.සමාජය කෙරෙහි ප්‍රබල ලෙස බලපැවැත්වෙන මෙම ජනමාධ්‍ය ඕනෑම සමාජයක වැදගත්ම සාධකයක් ලෙස සැලකිය හැකි ළමා පරපුර කෙරෙහි ද දැඩි ලෙස බලපෑම් කරනු ලබයි. ළමයා සහ මාධ්‍ය අතර වර්තමානය වන විට අවියෝජනීය සබඳතාවක් ගොඩනැගී ඇත. ජනමාධ්‍යයේ පවතින ආකර්ෂණීය බව මෙයට මූලිකවම හේතු වී ඇති අතර ළමයින් කෙරෙහි ධනාත්මකව මෙන්ම ඍණාත්මකව ද ක්‍රියාත්මක වන ස්වරූපයක් දක්නට ලැබේ. ජනමාධ්‍යයේ හිතකර සහ අහිතකර ලෙස බලපෑම කෙටි කාලීන හෝ දිගු කාලීන වශයෙන් මෙන්ම, ඍජු හා වක්‍ර වශයෙන් ද සිදු විය හැකිය.

*ISBN 978-955-4563-72-8*

## ජනමාධ්‍ය හා එහි කාර්යභාරය

මානව ශිෂ්ටාචාරය ආරම්භයේ සිටම, මානවයා සිය හැඟීම්, අවශ්‍යතාවයන් ප්‍රකාශ කිරීම උදෙසා විවිධ සන්නිවේදන ක්‍රමෝපායන් භාවිතා කරන්නට විය. ශතවර්ෂ ගණනාවක් තිස්සේ විවිධාකාරයෙන් පරිණාමයන්ට හා සංවර්ධනීය ලක්ෂණයන්ට ලක්වෙමින් පැවත ආ මානව සමාජය තුළ ක්‍රම ක්‍රමයෙන් සන්නිවේදන කාර්යයන් ද වර්ධනය වන්නට විය. මෙහි උච්ඡතම අවස්ථාව වත්මන් සමාජයෙහි වෙසෙන මිනිසුන් අත්විඳින්නේ 'ජනමාධ්‍ය' නම් වූ සුවිශේෂී ප්‍රපංචය මත පදනම්ව ය. මෙහිදී ජනමාධ්‍ය (Mass Media) යන වචනය තුළින් ඉදිරිපත් වන අර්ථය විමසිය යුතුය. ඒ අනුව ජනසන්නිවේදන ක්‍රියාදාමය තුළ භාවිතයට ගැනෙන වාහකය ලෙස ජනමාධ්‍ය හැඳින්වේ. මෙහිදී පොත්, පුවත්පත්, සඟරා ලිඛිත මාධ්‍ය ලෙස හැඳින්වේ. එසේම ගුවන් විදුලිය හා වෙනත් ශබ්ද මාධ්‍යයන් ශ්‍රව්‍ය මාධ්‍ය ලෙස ද, රූපවාහිනිය හා චිත්‍රපටය යන සන්නිවේදන මාධ්‍ය දෘශ්‍ය මාධ්‍ය ගණයෙහිලා ද සලකනු ලබයි.
ජනමාධ්‍ය යන්න පිළිබඳව යුනෙස්කො සංවිධානය මඟින් 1980 දී දක්වන ලද මතය වූයේ "ජනමාධ්‍ය යනු තොරතුරු හෙවත් පණිවුඩ යම්කිසි සන්නිවේදන ක්‍රියාවලියක් අනුගමනය කොට මහජනයා වෙත ගෙන යන වාහකයයි."(වික්‍රමසිංහ, තිස්ස නිහාල්. 2009) ඒ අනුව ජනමාධ්‍ය යනු එම සන්දේශ වඩා පුළුල් ග්‍රාහක පරාසයක් දක්වා විහිදීමට යොදාගනු ලබන තාක්ෂණික ක්‍රියාවලියක් යනුවෙන් අර්ථ දක්වා ඇත. සන්නිවේදනය පිළිබඳව අර්ථ විවරණ දක්වන විද්වතුන්ගේ පොදු මතයක් ලෙස සන්නිවේදනයේ විද්‍යාත්මක නැඟීම අනුව සිදුවූ චතුර්විධ නැඟීම, තොරතුරු සම්පාදනය, අධ්‍යයනය, පෙළඹවීම හා විනෝදාස්වාදය පෙන්වා දෙයි. මෙම චතුර්විධ වූ නැඟීමෙහි ඵලයන් ලෙස ග්‍රාහක සමාජයට සමීප කරන ප්‍රබලම සන්නිවේදන මාධ්‍ය ලෙස මෙම ජනමාධ්‍ය සැලකේ. ඒ අනුව ජනමාධ්‍යයේ පළමු සන්නිවේදන කාර්යයන් මානවයා තොරතුරු, අදහස්, සිතුවිලි, අත්දැකීම්, කථා කරන භාෂාව ලියා තබන්නට ගත් උත්සාහයෙන් ආරම්භ විය. රේඛා චිත්‍ර, කටු සටහන් ආදියෙන් අරඹන ලද මෙය පසුව විධිමත් ලේඛන කාර්යයන් සඳහා මිනිසාව මෙහෙය වන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස රෝමය, ඊජීප්තුව වැනි රටවල පුවත්පත් නිර්මාණයෙහි මූලික ලක්ෂණ පෙන්නුම් කරන ලියවිලි, ජූලියස් සීසර්ගේ කාලයේදී මෙන්ම ක්‍රිස්තු පූර්ව 16 වන සියවසේ දී ඊජිප්තුවේ Pha Oha නම් රජමාළිගාවේ 'පැපරෝසි' නම් පුවත්පතක් පැවැතීම තුළින් හෙළි වෙයි.

කෙසේ වෙතත් ක්‍රිස්තු පූර්ව 105 දී චීනයේ සැයිලුක් නැමැත්තා සේද, ශාක පත්‍ර ආශ්‍රයෙන් කඩදාසි නිපදවීමත්, 1440 ජර්මන් ජාතික ජොහැන්ස් ගුටෙන්බර්ග් විසින් මුද්‍රණ යන්ත්‍රය සොයා ගනීමත් සමඟ ලේඛන කලාවෙහි නව පෙරළියක් සිදු කරමින් පුවත්පත්, පොත්, සඟරා මඟින් ජනසන්නිවේදන ක්‍රියාවලිය පුළුල් වන්නට විය. මේ තුළින් කුටුම්බගතව තිබූ දැනුම, විද්‍යාව, තාක්ෂණය හා සංස්කෘතීන් විහිදී යාමක් ලේඛන කලාව ඔස්සේ සිදු විය. ලේඛනය මඟින් ජන සමාජය නව මාවතකට යොමු වන විට තවත් පිරිසක් 'හඬ' නමැති සාධකය පදනම් කරගනිමින් තොරතුරු සම්ප්‍රේෂණය කිරීම සඳහා 18 හා 19 වෙනි සියවස්හි උපරිම අයුරින් පර්යේෂණ කරන ලදි. ටෙලිග්‍රෑම්, මොරිස් සංඥා, ටෙලිෆෝනය ආදී දූරස්ථ සන්නිවේදන උපකරණ බිහිවන්නේ මෙහි ප්‍රතිඵලයක් ලෙසය. පසුව රැහැන් රහිතව ක්ෂණිකව පුළුල් වපසරියක් තුළ වැඩි ග්‍රාහක සමාජයකට තොරතුරු සම්ප්‍රේෂණය සඳහා ගුවන් විදුලි මාධ්‍ය බිහිවන්නේ මෙම පර්යේෂණ වල සාර්ථකත්වය මතය. ගුග්ලි එල්මෝ මාර්කෝනි විසින් මෙම ප්‍රගතිය සාර්ථක කරගන්නා ලදි. මුලදී යුධ හා නාවික කටයුතු සඳහා බහුලව භාවිතා වුවද 20 වෙනි ශතවර්ෂයෙහි මුල්කාලීනව යුරෝපීය සිවිල් ජන ජීවිතයේ අංගයක් බවට ගුවන් විදුලි මාධ්‍ය පත් වන්නට විය.

චලන චිත්‍රය පිළිබඳව ද සමකාලීනව විවිධ පර්යේෂණ දක්නට වූ අතර කැමරා ඔබ්සික්‍යුරාව නිපදවීමත් සමඟ මෙම සංකල්පයට නව මාවතක් විවර විය. මෙම තාක්‍ෂණික ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් ලෙස ජෝන් ලොගී බෙයාඩ් විසින් රූපවාහිනිය නිපදවන ලදි. යම් ස්ථානයකින් ග්‍රහණය කොටගෙන රූප බවට පත්කර ගැනීමේ ක්‍රියාවලියක් මෙහිදී සිදු වේ. මෙලෙස මානවයාගේ පරිණාමයත් සමඟම තොරතුරු සම්ප්‍රේෂණයේ පහසුව තකා මානවයාගේම පරිකල්පිය මනෝභාවයන් තුළින්ම මෙම ජනමාධ්‍ය බිහිවන්නට විය. මෙම ජනමාධ්‍ය හෙවත් සංහතික මාධ්‍ය ජනතාවගේ ජන විඥානය හා චර්යාවන් වෙනස් කිරීමට ප්‍රබල කාර්යයක් සිදු කරනු ලබයි. විද්‍යාව, තාක්‍ෂණය හා සංස්කෘතිය සීඝ්‍ර ලෙස මෙම ජනමාධ්‍ය ඔස්සේ සංවර්ධනය වන විට මිනිසාගේ ආකල්ප, චර්යා, විශ්වාස වෙනස් කිරීමේ ප්‍රධානම මෙවලම බවට ජනමාධ්‍ය පත්විය. මේ අනුව බලන කළ ජනමාධ්‍ය යනු විවිධ අංශයන්ගෙන් විවිධ ස්වරූපයන්ගෙන් මිනිස් අවශ්‍යතාවන් සපුරාලීම සඳහා මිනිසා විසින්ම නිපදවන ලද්දක් බව පැහැදිලිය. මිනිසාගේ තොරතුරු සන්නිවේදනයේ හා තොරතුරු දැන ගැනීමේ ආශාව හා කැමැත්ත මත පියවරෙන් පියවර ගොඩනැගුණු මිනිස්

*ISBN 978-955-4563-72-8*

අවශ්‍යතාවක් ලෙස ජනමාධ්‍ය පෙන්වා දිය හැකිය. මෙසේ බිහි වූ ජනමාධ්‍ය ක්‍රියාවලිය තුළ පිළිගත් ආචාර ධර්ම පද්ධතියක් ද දක්නට ලැබේ. ඒ අතර, සත්‍යවාදී බව - Truth Telling, නිදහස - Independence, හානිය අවම කිරීම - Minimizing Harm, වගකිව යුතු බව - Accountability යනාදී ලක්ෂණ හඳුනාගත හැකිය.

ජනමාධ්‍ය, ග්‍රාහක ජනතාවගේ විශ්වසනීය මාධ්‍ය වීම සඳහා ජනමාධ්‍ය මඟින් ඉදිරිපත් කරන තොරතුරුවල නිරවද්‍යතාවය (Accuracy) බෙහෙවින් බලපානු ලබයි. විශේෂයෙන්ම වත්මන් සමාජීය ජනතාව තොරතුරු ලෝකයක ජීවත් වන බැවින් ජනතාව හා මාධ්‍ය අතර පවතින අනුකලනාත්මක සබඳතාව බිඳ නොවැටීමට නම් ජනමාධ්‍ය මඟින් ජනගත කරන සෑම තොරතුරක්ම සත්‍යවාදී හා නිවැරදි විය යුතුය. නැතහොත් මෙම දෙපාර්ෂවයෙහිම බිඳ වැටීම සිදු වේ. එබැවින් ජනතාව ගුණාත්මක මාධ්‍ය ක්‍රියාවලියක් බලාපොරොත්තු වන බැවින් එය සත්‍යවාදී (Truth), නිවැරදි හා සාධාරණ (Accuracy and Fairness) විය යුතුය. එසේම තොරතුරු විචාරාත්මක, චින්තනමය හා පර්යේෂණාත්මක තලයක පිහිටා ගොඩනැඟීම ද මෙහිදී වැදගත් වේ. මාධ්‍ය නිදහස තහවුරු කිරීම තුළ ජනමාධ්‍ය හරහා ජනතාවට සම්ප්‍රේෂණය වන තොරතුරුවල සත්‍යවාදී බව හා ගුණාත්මක බව ද තහවුරු වෙයි. මෙහිදී තොරතුරු දැන ගැනීමේ නිදහස හා නිදහසේ තොරතුරු සහ මත බෙදාදීමේ අයිතිය ද තහවුරු වීම තුළින්, ග්‍රාහක ප්‍රජාව මෙන්ම ජනමාධ්‍යකරුවා ද සත්‍ය තොරතුරු දැනගැනීම හා බෙදාදීම, සමාජ ආචාර ධර්මීය පද්ධතියක් තුළින් පෝෂණය වේ. නමුත් ජනමාධ්‍යයේ නිදහස කිසිවිටෙකත් වල්බුරු නිදහසක් කර නොගත යුතුය. එයින් සමාජ බිඳවැටීම ආචාර ධර්ම හා සාරධර්ම පිරිහීම නිතැතින්ම සිදුවන බැවිනි. සෑම ජනමාධ්‍ය අංශයක්ම සිය තොරතුරු සම්ප්‍රේෂණය මඟින් සිදුවන හානිය අවම කිරීමටත්, ජනතාව හමුවේ තබන තොරතුරුවලට ඍජුව වගකිව යුතු ද වේ. ජනමාධ්‍යයේ බලපෑම අති ප්‍රබල වන හෙයිනි. මාධ්‍ය ආචාර ධර්ම හා සාරධර්ම මෙන්ම මාධ්‍ය නිදහස බිඳ වැටීම තුළ සමාජ ප්‍රගමන ක්‍රියාවලියට සම්බන්ධ අනෙකුත් සමාජ සාධක ද බිඳ වැටීමට ලක් වේ. මේ තුළින්, සමාජයේ ආරක්ෂාවට පවත්තා සිවිවන ආණ්ඩුවේ ක්‍රියාවලිය දුර්වල වීම, මාධ්‍ය පිළිබඳ මහජන විශ්වාසය (Public Credibility) බිඳ වැටීම, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී අපේක්ෂා බිඳ වැටීම, යනාදී අහිතකර සමාජ බලපෑම් ජනමාධ්‍යයේ බිඳ වැටීම තුළින් ඇති විය හැකිය.

මෙහිදී ජනමාධ්‍යයේ කාර්ය භාරය ද ඉතා වැදගත්ය. මිනිසාගේ පරිකල්පීය ශක්තිය මතින් ගොඩනැඟුණු ජනමාධ්‍ය අද මිනිසා පාලනය කරන මෙහෙයුම් යන්ත්‍රයක් බවට ද පත්ව ඇත. මිනිසා තුළ මෙන්ම සමාජය තුළත්, ජනමාධ්‍ය මඟින් සිදු කරනු ලබන වෙනස්කම් ආකාර තුනකින් සන්නිවේදන විශාරදයෝ පෙන්වා දෙති. එම වෙනස්කම් ලෙස, 'සමාජ වෙනසක් ඇති කිරීම, පවත්නා යථාර්ථය ග්‍රහණය කර ගැනීමට හෝ එයින් කෙනෙක් ඈත් කොට තැබීමට, ජනප්‍රිය සංස්කෘතිකාංග බිහිකිරීමට හා පවතින සමාජ තත්වයට ආගන්තුක වූ සමාජ ප්‍රවණතාවක් ප්‍රවේශ කිරීම,' යනාදිය ජනමාධ්‍ය මඟින් සිදු කිරීමට විශේෂ හැකියාවක් පවතී. විල්බර් ශ්‍රාම් ආචාර්යවරයා විසින් ජනමාධ්‍ය පිළිබඳව දාර්ශනික විග්‍රහය කරන අතර, ජනමාධ්‍ය සමාජ ක්‍රියාවලිය ඵලදායික ලෙස හැසිරවීමට මෙන්ම ජනමාධ්‍යයෙහි කාර්යභාරය ආකාර තුනක් ඔස්සේ දක්වා ඇත. එනම්, ආරක්ෂකයෙකුගේ කාර්ය ගැනීම (Watcher), සාකච්ඡා මණ්ඩපයක කාර්ය ගැනීම (Forum), ගුරුවරයෙකුගේ කාර්ය ගැනීම (Teacher), ආදී වගකීම් රැසක් ජනමාධ්‍ය සතු වන බව පැහැදිලිව දක්වා ඇත. සමාජ පැවැත්මේ හා ඉදිරි ගමනෙහි බිඳවැටීම හෝ අඛණ්ඩව පවත්වාගෙන යෑමේ ගාමක බලවේගයක් මාධ්‍ය සතු වන්නේ එබැවිනි. එනිසාම,

> "ජනමාධ්‍ය මහජන මතයේ කැඩපතක් වේ."
>
> "ජනමාධ්‍ය ආරක්ෂක මුර දේවතාවෙකි."

යනුවෙන් පොදුවේ සියලු ජනමාධ්‍ය සඳහා ව්‍යවහාරික වන්නේ මෙම කරුණු සනාථ කිරීමක් ලෙසය. නමුත් කණගාටුවට කරුණ නම් වත්මන් සමාජය තුළ ක්‍රියාත්මක ජනමාධ්‍ය මෙම සියලු ශක්‍යතා මත පදනම්ව ක්‍රියාත්මක වන්නේ ද යන්නය. ජනතාවාදී, සමාජ උන්නතිය හා ප්‍රගතිය උදෙසා, සදාචාරාත්මක සමාජයක පෙර ගමන්කරුවන් ලෙස සත්‍යවූත්, ගුණාත්මක, අර්ථවත් ජනමාධ්‍ය භාවිතයක් සිදු වන්නේද යන්න බරපතල ගැටලුවක් වෙමින් පවතී. වත්මනෙහි ලෝකය පුරා දැඩි විවේචනාත්මක, විචාරාත්මක පූර්විකාවක් ඔස්සේ ජනමාධ්‍යයෙහි ගුණාත්මක භාවය පිළිබඳව මානවයා විසින්ම ප්‍රශ්න කරමින් සිටී. මේ අනුව ජනමාධ්‍යයට සමාජයේ සෑම ඒකකයක්ම ඉලක්ක කොට ගනිමින් සමාජයට වැඩදායී මානව සමාජයක් ගොඩනැඟීමේ කාර්යභාරය පැවරී ඇත. ජනමාධ්‍ය හරහා සමාජානුගත කරන අදහස්, අරමුණු ඔස්සේ සමාජීය වශයෙන් සිදුවන බලපෑම වටහා ගෙන ඒ හරහා රටෙහි ආර්ථික, සමාජීය, ආගමික, ආධ්‍යාත්මික, සංස්කෘතික හා සදාචාරාත්මක හර පද්ධතීන් ධනාත්මකව වර්ධනය කිරීම ජනමාධ්‍යයේත්, ජනමාධ්‍යවේදීන්ගේත් වගකීම හා යුතුකම වන්නේය.

***ISBN 978-955-4563-72-8***

**ජනමාධ්‍ය හා ළමා පරපුර**

ව්‍යවහාරික සමාජයෙහි අධ්‍යාපනය, විද්‍යාව, තාක්‍ෂණය, සංස්කෘතිය, සදාචාරය, තොරතුරු යන සියලු ප්‍රපංචයන් ජනගත කරන, පොදු අවකාශයක් තුළ මෙහෙය වන ප්‍රධාන ගෝලීය නියාමනය ජනමාධ්‍යය'යි. සමාජ. ආර්ථික, දේශපාලනික වශයෙන් ද ගොඩනැඟීම්, බිඳ වැටීම් මෙහෙයවන බලවේගයක් බවට ද ජනමාධ්‍ය පත්ව ඇත. සමාජයෙහි කුඩාම ඒකකය වන 'පවුල' යන කුටුම්බගත සංස්ථාවේ සිට මහා සමාජය දක්වා ගෝලීයව සමාජය පාලනය කරන ප්‍රධාන නිර්ණායකයක් ලෙස ජනමාධ්‍ය හැඳින්විය හැකිය. විසි එක්වන සියවසෙහි තොරතුරු ලෝකයක් තුළ ජීවත් වන මානවයා සිය අභිචාරයන් ගොඩනඟා ගැනීමේ ප්‍රධාන මෙවලමක් ලෙස මෙම 'ජනමාධ්‍ය' නිතැතින්ම භාවිතා කරනු ලබයි. පොදු අවකාශයක් මත ගෝලීයව විශාල ග්‍රාහක සමාජයක් ගොඩනඟා ගැනීමට මානවයාගේ කුතුහලය, තොරතුරු දැනගැනීමේ ආශාව, බිය, විචාරාත්මක හා විශ්ලේෂණාත්මක ගති ලක්ෂණ ග්‍රහණය කරගනිමින් ඊට අනුරූප වන අයුරින් සමාජය මෙහෙයවීමට ජනමාධ්‍ය නිරන්තරයෙන් උත්සුක වෙයි. ශ්‍රව්‍ය - දෘශ්‍ය  මාධ්‍ය දෙකම උපයෝගී කොට ගනිමින් ජනමාධ්‍ය සමාජගත වී ඇත. විශේෂයෙන්ම මුද්‍රිත හා විද්‍යුත් ආඛ්‍යාන පදනම් කරගනිමින් පොත්, පුවත්පත්, සඟරා ආදී මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ද, රූපවාහිනිය, ගුවන් විදුලිය, සිනමාව ආදී විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ද ජනමාධ්‍ය ව්‍යාප්තව පවතී.

වත්මන් සමාජයෙහි පවතින බලය නම් සාධකය ජනමාධ්‍ය වෙත විස්තාපනය වී ඇති බවක් දක්නට ලැබේ. පශ්චාත් නූතන සමාජය තුළ මෙම ලක්ෂණය, සමාජය මෙහෙයවන අනිවාර්ය සාධකයක් බවට පත්ව ඇත. ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය යන ප්‍රධාන රාජ්‍ය බලයන්ට අමතරව සමාජයෙහි රාජ්‍ය නොවන බලයන් අතුරෙන් (මුදල් බලය, ජනමාධ්‍ය බලය, දැනුමේ බලය) සමාජයෙහි පිළිගත් සිව්වෙනි බලය ලෙස ජනමාධ්‍ය සලකයි. නමුත් වත්මනෙහි එම තත්වය බෙහෙවින් විවාදයට ලක්වෙමින් පවතී. අද වන විට බොහෝ ජනමාධ්‍ය මඟින් ලබාදෙන පූර්වාදර්ශයන් තුළින් සමාජ පර්යාය (Social Order) න්‍යායන් බිඳ වැටීමට ලක්වෙයි. සමහර ජනමාධ්‍ය මඟින් මෙම සමාජ පර්යාය සූක්ෂම ලෙස ප්‍රශ්න කරන අතර, තවත් මාධ්‍ය ප්‍රායෝගිකව මෙම සමාජ ක්‍රමයේ පිළිවෙළ අවුල් කිරීමට දායක වේ. සමකාලීන ජනමාධ්‍ය හා මානව සමාජය අතර පවතින සබඳතාව දෙස බැලූ කළ එය ඉතා සංකීර්ණව ව්‍යාප්ත වී ඇති ආකාරය දක්නට ලැබේ. නූතන ජනමාධ්‍ය සංස්කෘතිය බිහිවීමට ප්‍රථමව එතෙක් පැවති සමාජ ජීවන ශෛලීන්, ඉතා ගැඹුරු හා අවධානම් සහගතව විපර්යාසයන්ට ලක් වන්නට විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ නූතන සමාජය තුළ ජනමාධ්‍ය අත්පත් කරගෙන ඇති අවියෝජනීය සබඳතාවයි. මානව සමාජයෙහි දක්නට ලැබෙන විවධාකාර සමාජ ඒකකයන් අතුරෙන් ළමා පරපුර යනු සුවිශේෂී සමාජ ඒකකයකි. වැනසී යන ධර්මතාවයට පොදුවේ මුහුණ දෙන ලොව සියලු ජීවී අජීවී වස්තූන් අතුරෙන් ජීවී වස්තූන් සිය සමාජය ඊළඟ පරම්පරාවට පවත්වාගෙන යන්නේ අංකුර බීජයන් මඟින්. පොදුවේ සත්ව සමාජයෙහි අංකුර බීජ යනු දරවෝය. මානව සමාජයෙහි දරුවන් යනු සුවිශේෂී සමාජ ඒකකයකි. මෙම ළමා පරපුර කෙරෙහි ඍජු ලෙස ජනමාධ්‍යයෙහි ක්‍රියාකාරීත්වය ප්‍රබලව බලපානු ලබයි. මුද්‍රිත හා විද්‍යුත් වශයෙන් දක්නට ලැබෙන ජනමාධ්‍ය ළමා පරපුර හා අත්‍යන්තයෙන් බැඳී පවතී. මෙහිදී ළමයා සිය චර්යාවන් ගොඩනඟා ගැනීමට බාහිර පරිසරයෙන් ලැබෙන අනුබලය මත ක්‍රියාත්මක වන හෙයින්, ළමයා කුඩා අවදියෙහි සිටම ඔහුට මෙම ජනමාධ්‍යයන්ගේ ආභාෂය ලබන්නට හැකියාව පවතී. විශේෂයෙන්ම මුද්‍රිත මාධ්‍ය තුළින් ළමයාගේ මානසික ආකල්ප, චර්යාවන් ගොඩනැඟීම කුඩා කළ සිටම සිදු වෙයි. භාෂාව දියුණුවීමත් සමඟ දරුවා මුද්‍රිත මාධ්‍ය හා සහසම්බන්ධව ක්‍රියා කරනු ලබයි. වර්තමානය තුළ මුද්‍රිත මාධ්‍ය හරහා ළමා පරපුරෙහි ආකල්පමය, චර්යාමය වෙනස්කම් කිරීමට ප්‍රබල දායකත්වයක් දක්වයි. පොදුවේ මුද්‍රිත මාධ්‍යයට යොමු වන ළමුන් ප්‍රමාණය සීඝ්‍ර ලෙස අඩු වුවද, එම අඩුව පියවීම සඳහා මෙන්ම ළමා පරපුර මුද්‍රිත මාධ්‍ය කෙරෙහි ආකර්ශනය කරගැනීමට විවිධ උපක්‍රම භාවිත කරනු ලැබයි. විශේෂයෙන්ම මුද්‍රිත මාධ්‍ය හරහා යහපත් ආකල්ප හා සමාජය පිළිබඳව සදාචාරාත්මක කියවීමක් සිදුකරන නමුත් වත්මනෙහි එම තත්වය වෙනස් වී ඇති බවක් දක්නට ලැබේ. ළමුන් සඳහාම වූ මුද්‍රිත මාධ්‍ය බිහිවුවද ඒවායෙහිත් වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ වල්පල් ය. හොඳ ළමා නවකතාවක්, කෙටි කතාවක් දක්නට නැති තරම්ය. ළමා පුවත්පත්, සඟරා පිළිබඳ දක්නට ලැබෙන්නේ ද එවැනිම තත්වයකි. ළමා පොත පත, පුවත්පත්, සඟරා දක්නට ලැබුණ ද ඒවා ළමුන්ට යෝග්‍ය ද යන්න ගැටලු සහගතය. අද මුද්‍රිත මාධ්‍යයෙහි සෑම නිර්මාණයක්ම දක්නට ලැබෙන්නේ වැඩිහිටි මානසිකත්වයෙන් පමණක් කියවන්නට, දකින්නට ලැබෙන ආකාරයේ මාධ්‍ය භාවිතයකි.

මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ළමුන්ගේ අධ්‍යාපනයට, චර්යා ධර්ම වලට, සදාචාරයට අනුබල දෙන මාධ්‍ය සංකල්පයන් සහිත පොත්, සඟරා, පුවත්පත් දක්නට ලැබෙන්නේ අතළොස්සකි. ඒවායෙන් සමහරක් ද ළමා සිත දූෂණය කරනාකාරයේ දර්ශන වලින් යුක්තය. විශේෂයෙන්ම ළමුන්ගේ ආකර්ශනය දිනා

***ISBN 978-955-4563-72-8***

ගැනීමේ අදහසින් මුද්‍රිත මාධ්‍ය කරන එක් නිහීන ක්‍රියාවක් ලෙස පොතපත්, සඟරා, පුවත්පත් අලංකරණය සඳහා කාන්තාවන්ගේ රූප භාවිතය වැඩි වශයෙන් වත්මන් මුද්‍රිත මාධ්‍ය තුළ දක්නට ලැබේ. සමස්තයක් ලෙස මුද්‍රිත මාධ්‍යයෙන් ළමුන්ට වන අහිතකර බලපෑම් අඩු මට්ටමක පවතී. නමුත් එය එකහෙළා බැහැර කළ නොහැක. බඩගෝස්තරවාදී ලේඛන පරපුරක් හිමිව ඇති ලංකාවෙහි මුද්‍රිත මාධ්‍ය සදාචාරය අන්තයටම පිරිහෙමින් පවතී. එහි ගොදුරක් වීමට සිදුවීම අනාගතයෙහි සමාජය මෙහෙයවනු ලබන වත්මන් ළමා පරපුරට අභාග්‍ය සම්පන්නය. මුද්‍රිත මාධ්‍ය තුළින් ළමයාගේ සමාජානුයෝජන ක්‍රියාවලිය විධිමත්ව සිදුකළ හැකිය. අතීතයෙහි විද්‍යුත් මාධ්‍ය නොතිබුණු හෙයින් මුද්‍රිත මාධ්‍ය හරහා දැනුම, ආකල්ප, සදාචාරය, සංවර්ධනය යන සියලු අංශ පෝෂණය කරමින් මුද්‍රිත මාධ්‍ය ක්‍රියාත්මක විය.

වර්තමානයෙහි මුද්‍රිත මාධ්‍යයට වඩා මිනිස් මනසට බලපෑමක් කළ හැකි ප්‍රබලම මාධ්‍ය බවට පත් වී ඇත්තේ විද්‍යුත් මාධ්‍යයයි. මෙහිදී රූපවාහිනිය, ගුවන් විදුලිය, පරිගණකය, අන්තර්ජාලය ආදී විද්‍යුත් මෙවලම් ඔස්සේ ජන මතයට විශාල බලපෑමක් කිරීමට සමත්ව ඇත. මිනිස් මනස ප්‍රබෝධමත් කරමින්, විටෙක සතුට ද, වෛරය ද, මානසික නිදහස අහිමි කිරීම් ද සිදු කරමින් මානව චින්තනය උඩු යටිකුරු කිරීමට මෙම විද්‍යුත් මාධ්‍ය මඟින් බලපෑමක් එල්ල කරමින් සිටී. සමස්ත ජනමාධ්‍ය පද්ධතිය තුළ සමාජීය වශයෙන් ද, පුද්ගලිකව ද ප්‍රබල බලපෑමක් එල්ල කරමින් සමාජයෙහි තීරණාත්මක ආධිපත්‍යයක් හිමි කරගෙන ඇති ප්‍රධාන විද්‍යුත් මාධ්‍ය ලෙස රූපවාහිනිය අර්ථ දැක්විය හැකිය. රූපවාහිනිය යනු ජනතාවගේ මානව හා සදාචාරාත්මක වර්ධනය ද බුද්ධි වර්ධනය ද සිදුකළ හැකි ප්‍රධාන ජනමාධ්‍ය මෙවලමකි. මෙම මාධ්‍ය ඉලක්ක වන්නේ පොදුවේ සමාජයෙහි පවුල කෙරෙහිය. නිවස තුළ ජීවත් වන සියලු සමාජිකයන්ගේ පොදු මෙවලමක් ලෙස රූපවාහිනිය ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත් රූපවාහිය නම් මාධ්‍ය තුළින් පවුලේ වැඩිම අවධානය දිනාගන්නේ, සමාජය දෙස විපරම් සහගතව බලමින් අලුත් ලෝකයකට අනුගත වන ළමයා ය. දෙමාපියන්ගේ නොදැනුවත්කම හෝ දරුවා කෙරෙහි දක්වන සැලකිල්ල මඳකමට හෝ වේවා රූපවාහිනිය වර්තමාන ළමා පරපුරට හිතකර මෙන්ම අහිතකර ලෙස ද ප්‍රබලව බලපානු ලබයි. මේ අතරිනුත් ළමයාගේ අහිතකර ක්‍රියාකලාපයන්ට ප්‍රබලව උත්තේජනයක් මෙයින් සපයනු ලබයි. සරලව කියතොත්, සමාජයෙහි සියලු දෙමාපියන් රූපවාහිනිය ඉදිරියෙහි සිය නිරුවත ප්‍රදර්ශනය කරමින්, එම නිරුවත හරහාම සිය දරුවාගේ මනස විකෘති කරමින්, සදාචාරය විනාශ කරමින් පිළිකුල් සහගත මාධ්‍ය ඇබ්බැහි වීමක් රූපවාහිනිය තුළින් පෙන්නුම් කරයි. මෙසේ මුළු මහත් සමාජය පුරාම කුල භේද, ජාති භේද, ආගම් භේද වලින් තොරව සැමට එක්සේ බලපාන අයුරින් සමාජය වෙලාගෙන සිටින රූපවාහිනිය විවිධ සන්දේශ සමාජගත කරනු ලබයි. ඒ අනුව, ප්‍රවෘත්ති හා තොරතුරු සම්පාදනය, විග්‍රහය හා විවරණ සම්පාදනය, අධ්‍යාපනය සහ සමාජානුයෝජනය, පෙළඹවීම සහ මහජන සම්බන්ධතාව, වෙළදාම සහ දැන්වීම් ප්‍රචාරණය, විනෝදාස්වාදය සහ කලාව, යනාදී වශයෙන් රූපවාහිනිය මඟින් සමාජය වෙත තොරතුරු සම්ප්‍රේෂණය කරමින් සමාජය විවිධාකාරයෙන් මෙහෙයවනු ලබයි. මෙම සන්දේශ අතුරෙන් අධ්‍යාපනය සහ සමාජානුයෝජනය කෙරෙහි වර්තමානයේදී ප්‍රබල බලපෑමක් රූපවාහිනිය හරහා සිදු වේ. රූපවාහිනිය ආරම්භක අවධියේ ඉතාමත් වැදගත් ලෙස සැලකුණු අධ්‍යාපන අංශය මේ වන විට වැදගත්කමින් අඩු වී ඇති ආකාරයක් දැකිය හැකිය. සියලුම රූපවාහිනී නාලිකා වාණිජ පරමාර්ථ මුල් කරගෙන කටයුතු කරනු ලබයි. මෙම ප්‍රවණතාවය පිළිබඳව විල්බර් ශ්‍රාම් දක්වන්නේ මෙබඳු අදහසකි. "මෙම දශකයේ දී දශ ලක්ෂ 150ක් පමණ පිරිසක් සාලයේ ඇති රූපවාහිනියට යෝග්‍ය ලෙස තම ජීවිත අලුතින් සකස්කර ගත්හ. විශේෂයෙන් රූපවාහිනිය ළමයින් සිටින ගෙවල්වල විනෝදය ලබා දෙන ප්‍රධාන මාධ්‍ය බවට පත්විණි. චිත්‍රපටවල, විනෝද කතා පොත්වල, ළමා රැකවරණ ආයතනවල සහ එකට එක් වී සෙල්ලම් කරන යහළුවන්ගේ තැන ඉතා ඉක්මණින් රූපවාහිනිය තමා වෙත පවරා ගත්තේය. එය මුළු ලෝකයම ගෙදර සාලයට ගෙනාවේය, එය ළමයින්ට දුර පළාත් ඉක්මණින් දැක ගන්නත් වැඩිහිටියන්ගේ හැසිරීම් ඉක්මණින් බලා ගන්නත් සලස්වා ඇත. හොඳම හා වැඩිම ශබ්දය ඇති බඩු විකුණන්නා බවට රූපවාහිනිය පත් විය. එය වීරයන්, දුෂ්ටයන්, පිස්සන් වැනි චරිත වෙනස් නොවන අයුරින්, කල් පවතින අයුරින් පහසුවෙන් නැමෙන ළමයින්ගේ සිත් තුළට සාර්ථකව ඇතුළත් වී ඇත." රූපවාහිනී මාධ්‍ය වර්ධනය සහ ව්‍යාප්තිය සමඟ එය විවිධ සමාජ ස්ථරවලට අයත් මිනිසුන්ගේ ආවේණික ශික්ෂණ ක්‍රමවල ප්‍රබල වෙනසක් ඇති කර තිබේ. මිනිසා තුළ ගොඩනැඟෙන පරිකල්පනය, චින්තනය, හැසිරීම් රටාව ආදිය ගොඩනැඟීමට වත්මනෙහි මූලික වන්නේ රූපවාහිනී මාධ්‍යය යි. මෙය පොදුවේ ළමා පරපුරට ඍජුවම බලපා ඇත. විශේෂයෙන්ම රූපවාහිනී වැඩසටහන්වල පවතින දුර්වලතා මෙන්ම ප්‍රබලතා නිසිලෙස හඳුනා නොගෙන අයාලේ යන මාධ්‍ය සංස්කෘතියක් තුළ වැඩසටහන් නිර්මාණය කොට රූපවාහිනිය හරහා ප්‍රචාරය කිරීම තුළින් වත්මන් ළමා පරපුර අභියෝග රැසකට මුහුණ පාමින් සිටී.

***ISBN 978-955-4563-72-8***

මෙහිදී රූපවාහිනී වැඩසටහන් කෙබඳු ස්වරූපයන් ගන්නේදැයි විමසා බැලිය යුතුය. එය රූපවාහිනී වැඩසටහන් හරහාම අධ්‍යයනය කිරීම වැදගත්ය. ඒ අනුව රූපවාහිනී වැඩසටහන් විවිධාකාරයෙන් සමාජගත වී ඇත. ඒ අතරින්, අධ්‍යාපන වැඩසටහන්, ළමා වැඩසටහන්, ප්‍රවෘත්ති, විවිධ වාර්තා වැඩසටහන්, සංවාද, ගවේෂණාත්මක වැඩසටහන්, කාටූන්, චිත්‍රපට, වෙළඳ දැන්වීම්, විනෝදාස්වාද වැඩසටහන් (සංගීතය, නර්තනය, හාස්‍ය උත්පාදන ආදී), කාන්තාවන් වෙනුවෙන් වෙන්වුණු වැඩසටහන් (ඉවුම්-පිහුම්, මැහුම්-ගෙතුම්, රූපලාවන්‍ය, විවාහ මංගල අවස්ථා), යෞවනයන් වෙනුවෙන් වෙන්වුණු වැඩසටහන්, දේශපාලන වැඩසටහන්, ආගමික වැඩසටහන් ආදී වැඩසටහන් ප්‍රධාන ලෙස රූපවාහිනිය තුළ දක්නට ලැබේ. මේ අතරින් ළමා වැඩසටහන් ලෙස ක්‍රියාත්මක වන්නේ අතළොස්සකි. අධ්‍යපනික වැඩසටහන්, ළමා වැඩසටහන්, ප්‍රවෘත්ති, විවිධ වාර්තා වැඩසටහන් හා ගවේෂණාත්මක වැඩසටහන් ආදිය පමණක් ළමුන් වෙනුවෙන් රූපවාහිනිය තුළ ප්‍රචාරය වේ. මෙහිදී ළමා වැඩසටහන්හි ස්වරූපය හඳුනා ගැනීම ඉතා වැදගත්ය. ඒ අනුව ළමා වැඩසටහනක් සැමවිටම අධ්‍යාපනික ස්වරූපයන් ගත යුතුය. සදාචාරාත්මක චර්යා වර්ධනය, බුද්ධි වර්ධනය, විචක්ෂණශීලී බව වඩවන, විචාර පූර්වක බව ඇති කරන, ළමයා හික්මවන සුළු ලක්ෂණ ළමා වැඩසටහන්හි අන්තර්ගත විය යුතුය. එම වැඩසටහන්හි ළමා මනසට ගෝචර වන ලෙස රූපය ද, භාෂාව ද භාවිතා කිරීම වැදගත්ය. ළමා මනස තුළ ප්‍රචණ්ඩත්වය, වෛරය, බිය, කාමුත්වය ඇති වන ආකාරයේ ආකල්පයන් එම වැඩසටහන් තුළින් ඉවත් විය යුතුය.

ළමා කාලය යනු විශේෂයෙන්ම අනුකරණවාදී අවධියක් වන හෙයින් ළමා වැඩසටහන් ඊට අනුරූප වන ආකාරයෙන් ඉදිරිපත් කළ යුතුය. එහිදී දරුවාගේ බුද්ධි වර්ධනය, සදාචාර වර්ධනය, ගුණ ධර්ම වර්ධනය ආදී සමාජ අවශ්‍යතාවන් සපුරාලන, ළමා මාසික රෝගයන්ට, විශේෂයෙන් අසහනය වැනි තත්වයන්ට ළමයා ඔරොත්තු දෙන ආකාරයෙන් මෙම ළමා වැඩසටහන් රූපවාහිනිය තුළින් ඉදිරිපත් විය යුතුය. විල්බර් ශ්‍රාම්, ජැක් ලයිලි, එඩ්වින් පාකර්, යන පර්යේෂකයන් පෙන්වා දෙන ආකාරයට දරුවන් මූලිකවම ක්‍රම තුනකින් රූපවාහිනිය භාවිතයට ගන්නා බව පෙන්වා දෙයි. එම ක්‍රමවේදයන් ලෙස, 'සුරංගනා කතාවක් ලෙස නැතහොත් මනඃකල්පිතයක් ලෙස, විනෝදාශ්වාදය ලබා දෙන මාධ්‍යක් ලෙස, උපදෙස් ලබා ගැනීම සඳහා' යනාදිය පෙන්වා දිය හැකිය. මේ අනුව ළමා වැඩසටහන් නිර්මාණයේ දී මෙම අවස්ථා තුන පිළිබඳව සැලකීම ඉතා වැදගත්ය. ළමා මනසට ගෝචරවන පරිදි සරල, සුගම, උපදේශාත්මක, අධ්‍යාපනික මෙන්ම දරුවාගේ චින්තන හැකියාව වර්ධනය වන ආකාරයට ළමා වැඩසටහන් නිර්මාණය කළ යුතු බව පැහැදිළිව දක්නට ලැබේ. එබැවින් සෑම ළමා වැඩසටහනක්ම ළමයින්ගේ ආකල්ප හැසිරීම් වර්ධනයට උපදේශාත්මක ස්වරූපයෙන් ඉදිරිපත් කළ යුතුය. මෙසේ රූපවාහිනි හරහා ළමුන්හට ඉදිරිපත් කරනු ලබන වැඩසටහන් කිහිපයක් පිළිබඳව විමසා බැලීමේදී, අධ්‍යාපනික වැඩසටහන්, වාර්තා වැඩසටහන්, ගවේෂණාත්මක වැඩසටහන්, කාටූන් වැඩසටහන් යනාදිය ළමුන් සඳහාම ඉදිරිපත් කරනු ලබයි.

රූපවාහිනිය යනු අධ්‍යාපනික මෙවලමකි. පාසල් අධ්‍යාපනය තුළදී ළමයා විවිධ අසහනකාරී තත්වයන්ට මුහුණ දේ. එසේම හදාරනු ලබන දේ ඉතා ඉක්මනින් අමතක වීමේ ස්වභාවයක් ද දක්නට ලැබේ. නමුත් මෙම තත්වය සමනය කළ හැකි සාර්ථකම මාධ්‍යයක් ලෙස රූපවාහිනිය පෙන්වා දිය හැකිය. ළමයාගේ ආකර්ෂණීයම මාධ්‍ය රූපවාහිනිය වන බැවින් දැන හෝ නොදැන දරුවා කුඩා කල සිටම ශබ්ද හා රූප පදනම් කොටගෙන රූපවාහිනිය ඉදිරිපිට සිටින කාලය වැඩි වී ඇත. උදෑසනත්, සවස් කාලයත් දරුවා නිතැතින්ම රූපවාහිනිය නරඹන අතර මෙම කාලය තුළ අධ්‍යාපනික වැඩසටහන් බලන්නට සැලැස්වීම ඉතා වැදගත්ය. මෙහිදී රූපවාහිනිය මඟින් ඉදිරිපත් වන අධ්‍යාපනික වැඩසටහන් විද්‍යාව, සාහිත්‍ය, කලාව, සදාචාරාත්මක චර්යා වර්ධනය ආදී තේමාවන් යටතේ සිදු වේ. වර්තමානයෙහි මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් වන අධ්‍යාපනික වැඩසටහන් බොහෝ සෙයින් අඩු මට්ටමක පවතී. අධ්‍යාපනය සම්බන්ධයෙන් රූපවාහිනියට දැඩි විවේචනයන් එල්ලවීම ද දක්නට ලැබේ. කෙසේ වෙතත් මෙම මාධ්‍ය තුළ ගුණාත්මක අධ්‍යාපනික වැඩසටහන් නැතුවාද නොවේ. එයට හොඳම නිදසුනක් ලෙස 1982 දී ආරම්භ වූ 'මුතුහර' අධ්‍යාපනික වැඩසටහන පෙන්වා දිය හැකිය.

රූපවාහිනී මුතුහර ළමා සමාජ සන්නිවේදන ක්‍රියාදාමය මඟින් රූපවාහිනිය නිසා ළමයින් අධ්‍යාපනයට දක්වන අලස බව, පුද්ගලාන්තර සන්නිවේදන අවස්ථා නැති වී යාම, මානසික ඒකාග්‍රතාවය බිඳීයාම, සිතනවා වෙනුවට පෙන්වන දේ භාරගැනීමට සිදුවීම, දුටු දේ පිළිබඳ කතාබහට ඉඩ නොලැබීම, ඇබ්බැහි වීම, රූපවාහිනිය කරදරයක් බවට පත්වීම යන සංසිද්ධීන් සියල්ලටම ප්‍රතිකර්මයක් සැලසෙන අයුරින් නව සන්නිවේදන ක්‍රියාකාරකම් රැසක් හඳුන්වා දෙමින්, ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරවමින් හා ඇගයීමට ලක්කරමින් ක්‍රියාත්මක කරනු ලබයි. මීට අමතරව 'දැනුමයි වාසනාවයි', 'The Debater' ආදී වැඩසටහන් ද සාර්ථක අධ්‍යාපනික වැඩසටහන්

ISBN 978-955-4563-72-8

ලෙස පෙන්වා දිය හැකිය. මුතුහර අධ්‍යාපනික ළමා වැඩසටහන මඟින් පොදුවේ සමස්ත ළමා පරපුරටම පාසලෙන් ලැබෙන අධ්‍යාපනික දැනුමට අමතරව හොඳ මඟ පෙන්වීමක් ලැබේ. මේ තුළින් ළමයාහට මනා අධ්‍යාපනික පෞරුෂයක් ගොඩනැංවීමේ හැකියාව ද ලැබේ. අවාසනාවකට මෙන් වර්තමාන මාධ්‍ය තුළ මෙවැනි අධ්‍යාපනික වැඩසටහන් දක්නට දුලබ වීම ඛේදවාචකයකි. අධ්‍යාපනික වැඩසටහන් නිර්මාණයේදී හා ප්‍රචාරණයේ දී සමස්තයක් ලෙස දරුවන්ගේ ආකල්ප, බුද්ධි මට්ටම්, වයස් මට්ටම් ආදිය පිළිබඳව වඩා සැලකිපිමත් විය යුතුය. මුතුහර, සැරිසර, The Debater ආදී අධ්‍යාපනික වැඩසටහන්, ඉතා සාර්ථකව අධ්‍යාපන මෙවලමක් ලෙස 'රූපවාහිනිය' භාවිතා කරනු ලබන්නේ ඉහත කරුණු සාර්ථකව හඳුනා ගැනීම තුළය. ජාතික රූපවාහිනිය මඟින් ළමා පරපුරට දායාද කළ වටිනා අධ්‍යාපනික ළමා වැඩසටහන් ලෙස 'මුතුහර' හා 'සැරිසර' යන අධ්‍යාපනික වැඩසටහන් ඉතා වැදගත් වන්නේ මේ තුළින් ළමුන්ගේ ලෝකය සත්‍ය වශයෙන් නිර්මාණය වන හෙයිනි. විශේෂයෙන්ම ළමයින්ගේ සිතුවිලි, චර්යා ධර්ම, සදාචාරවත් බව, බුද්ධිය, කණ්ඩායම් ක්‍රියාකාරකම්, සහයෝගීතාවය, සහෝදරත්වය මෙන්ම සමාජීය දැනුම සෑම ආකාරයකින්ම ළමුන්ට ලබා දෙන වැඩසටහනක් ලෙස 'මුතුහර' හැඳින්විය හැකිය. එසේම සැරිසර වැඩසටහන තුළ ලංකාවෙහි පමණක් නොව ලෝකය පුරා සමාජ, ආර්ථික, සංස්කෘතික, ආගමික, අධ්‍යාපනික මෙන්ම පාරිසරික වශයෙන් විශාල දැනුම් සම්භාරයක් එක්තැන් වන වැඩසටහනක් ලෙස පෙන්වා දිය හැකිය.

මීට අමතරව ස්වාධීන රූපවාහිනය මඟින් ඉදිරිපත් කරන 'තක්ෂිලාව' අධ්‍යාපනික වැඩසටහන ද ඉතා සුවිශේෂී වේ. උදෑසන 5.00 ට ආරම්භ වන මෙම අධ්‍යාපනික වැඩසටහන පාසල් අධ්‍යාපනය හදාරණ දරුවන්ට මහගු අත්වැලක් සපයයි. පාසල් විෂය නිර්දේශයන්ට අනුකූලව අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙය වීමෙන් සිදුකරනු ලබන මෙම අධ්‍යාපනික වැඩසටහන පාසල් ළමුන්ගේ බුද්ධි වර්ධනයට, විෂය සමගාමී ක්‍රියාකාරකම් වර්ධනයට නිතැතින් උපකාර වේ. එසේම ජාතික රූපවාහිනියෙන් විකාශනය වන 'මිණි පහන් වැට', 'හුරු බුහුටි' ආදී වැඩසටහන් ද පුංචි දරුවන්ගේ විනෝදයට හා යහපත් චර්යා ගොඩ නැංවීමට හේතුවක් බවට පත් වේ. වර්තමාන මාධ්‍ය භාවිතයෙහි අනිසි අතුරුඵල වලට ළමා පරපුර මුහුණ දෙනවාසේම එම මාධ්‍ය භාවිතය තුළින්ම ළමුන්ගේ හැකියාවන් වර්ධනය කරන ප්‍රායෝගික ළමා වැඩසටහක් ලෙස සිරස නාලිකාව හරහා විකාශනය වන 'The Debater' නම් විවාද වැඩසටහන ද පෙන්වා දිය හැකිය. ළමුන්ගේ ආකල්ප වර්ධනයට, සහයෝගීතාවයෙන් යුතුව අත්වැල් බැඳගෙන අභියෝග වලට මුහුණ දීමේ ඇති හැකියාව, පෞරුෂ වර්ධනයට මනා මෙහෙය වීමක් මෙම අධ්‍යාපනික වැඩ සටහන තුළින් සිදු වේ. පොදුවේ මෙම සියලු අධ්‍යාපනික වැඩ සටහන් ළමා පරපුරෙහි අභිවෘද්ධියට මං සලසන බව සඳහන් කළ යුතුමය.

මෙම අධ්‍යාපනික වැඩසටහන්වලට අමතරව රූපවාහිනිය තුළින් ළමයින් හමුවේ තබන වැදගත් වැඩසටහන් ලෙස වාර්තා වැඩසටහන් හා පර්යේෂණාත්මක වැඩසටහන් පෙන්වා දිය හැකිය. Discovery වැනි විදේශීය වාර්තා හා පර්යේෂණ අඩංගු වැඩසටහන් තුළින් ළමුන්හට සමාජය, ලෝකය හා විශ්වය පිළිබඳව හසල දැනුමක්, අවබෝධයක් ලබා දෙනු ලබයි. නමුත් කනගාටුවට කරුණ නම් මෙම වැඩසටහන් වර්තමාන ශ්‍රී ලංකා රූපවාහිනී මාධ්‍ය තුළ ඉතා අඩු වශයෙන් දක්නට ලැබීමයි. වාර්තා හා පර්යේෂණාත්ම වැඩසටහන් ළමුන්ට උචිත වන ලෙස ප්‍රචාරය වීමක් ද දක්නට නොලැබේ. නමුත් 'ලෝක සිතියම', 'ලොව වටා හිරු' ආදී වැඩසටහන් මෙහි දී තරමක් දුරට ළමුන් සඳහා අධ්‍යාපනික මෙහෙවරක නියුතු වන බවක් දක්නට ලැබේ. කෙසේ වෙතත් වර්තමානයෙහි ජනමතය හා ළමා පරපුර අතර පවතින අවියෝජනීය බැඳීම මෙම වැඩසටහන් මතම රඳා නොපවතියි. මෙම වැඩසටහන් කෙරෙහි දරුවා යොමු කරවීමක් දෙමාපියන් විසින් සිදු කරනු ලබන්නේ ඉතා අල්ප වශයෙනි. මෙයට හේතුව දෙමාපියන් ජනමාධ්‍ය තුළ වහල් භාවයට පත් වීමයි. එම වහල් භාවය පදනම් කොටගෙන අවිචාරවත්, අශික්ෂිත ජනමාධ්‍ය ගවේෂණයක් සඳහා දරුවන් ද, දෙමාපියන් විසින්ම හසුරවනු ලබයි. ජනමාධ්‍යයේ වගකීම සෑම විටම සමාජයට නිවැරදි දේ, සත්‍ය හා පිරිසිදු දේ මෙන්ම සදාචාරවත් දේ ලබා දීමයි. සමාජයෙහි මෙන්ම දෙමාපියන්ගේ වගකීම එම සදාචාරවත්, නිවැරදි දේට තම දරුවන් යොමු කිරීමයි. දෙමාපියන් හා සමාජය විචාරවත් හා විචක්ෂණශීලී නම් ජනමාධ්‍ය කෙසේ හැසිරුණ ද තම එකම සම්පත වූ දරුවන්ට හොඳම දේ ලබා දීමට කටයුතු කරණු ලබයි. නමුත් වර්තමානයෙහි ඇති වී තිබෙන ඛේදවාචකය වන්නේ, ජනමාධ්‍ය ද සමාජය ද හැසිරෙන්නේ නින්දිත, නිහීන ලෙස බැවිනුත්, දෙමාපියන් ද මෙම ඛේදවාචකයට නතු වී ඇති බැවිනුත්, සමාජීය සත්වයාගේ ක්‍රියාවන්, අභිචාරයන් තීරණය කරන මෙහෙයුම් කාරකය, යෙදුම් කාරකය ජනමාධ්‍ය වන බැවින් ළමා පරපුරට ද අත් වන්නේ එම ඉරණම ය.

*ISBN 978-955-4563-72-8*

### ළමා පරපුර කෙරෙහි ජනමාධ්‍යයේ බලපෑම

ජනමාධ්‍යයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව විමසීමේ දී, සමකාලීන ජනමාධ්‍ය හා මානවයා අතර පවතින්නේ ඉතා සංකීර්ණ වූ ස්වභාවයකි. ඒ අතරිනුත් ජනමාධ්‍ය හා ළමා පරපුර අතර ඇතිව තිබෙන්නාවූ සබඳතාවය වර්තමාන ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය මෙන්ම ළමා පරපුරෙහි චර්යාත්මක විපර්යාසය කෙරෙහි පවතින්නේ ජුගුප්සා ජනක තත්වයකි. මෙයට ප්‍රධාන හේතුව වන්නේ නූතන ජනමාධ්‍ය සමාජීය ආයතනයක් ලෙස ළමා පරපුර ඇතුලු සමස්ත ජන ජීවිතයටම තීරණාත්මක බලපෑමක් කිරීමේ සක්‍යතා දිනෙන් දින ඉහළ යෑමයි. ඉහතදී සාකච්ඡා කරන ලද පරිචයන්හි ජනමාධ්‍ය, එහි ස්වභාවය, කාර්යභාරය මෙන්ම ළමයා පිළිබඳව ද දීර්ඝ ලෙස කරුණු දක්වන ලදි. මෙහිදී ජනමාධ්‍ය, සමාජය ඉදිරියෙහි පෙනී සිටින ආකාර කිහිපයක් විශේෂයෙන් දක්නට ලැබේ. ජෝන් ෆික්සන් Introduction of Communication Studies යන ග්‍රන්ථයේ දී මෙම වර්ග තුන පිළිබඳව සඳහන් කරනු ලබයි. එනම්,

1. ඉදිරිපත් කිරීමේ මාධ්‍ය (Presentational Media)
2. නියෝජනාත්මක මාධ්‍ය (Represaentational Media)
3. යාන්ත්‍රික මාධ්‍ය (Merchanical Media) යනුවෙනි.

මෙහිදී ඉදිරිපත් කිරීමේ මාධ්‍ය සඳහා කටහඬ, මුහුණ, සිරුර, කථා කරන වචන, ඉඟි ආදිය යොදා ගන්නා අතර සන්නිවේදකයා මෙහිදී ප්‍රධාන වේ. නියෝජනාත්මක මාධ්‍ය ලෙස පොත්, පුවත්පත්, සඟරා, සිතුවම්, ඡායාරූප ආදිය භාවිත කරමින් සංස්කෘතික හා සෞන්දර්යාත්මක සම්මුති ද භාවිතා කරමින් මුද්‍රිත කෘති ලෙස ඉදිරිපත් වේ. ටෙලිෆෝනය, රේඩියෝව, රූපවාහිනිය, චිත්‍රපටය ආදිය යාන්ත්‍රික මාධ්‍ය ගණයට ඇතුළත් ය. මෙම ජනමාධ්‍ය ඔස්සේ සමාජයට විවිධාකාරයෙන් ධනාත්මක මෙන්ම ඍණාත්මක බලපෑමක් සිදුකළ හැකිය. ඉහත සඳහන් ජනමාධ්‍යයන් ඔස්සේ නිකුත් කරනු ලබන සන්දේශ සමාජීය ග්‍රාහක ප්‍රජාව කෙරෙහි බලපෑම් කරනු ලබන ආකාර තුනක් පිළිබඳව ජනමාධ්‍ය ආචාර්යවරුන් පෙන්වා දෙයි. එනම්, එකිනෙක පුද්ගලයා තුළ පවතින විවිධත්වය අනුව, සමාජ විවිධත්වය අනුව, සමාජ සම්බන්ධතා අනුව යනාදී වශයෙනි. මෙහිදී ග්‍රාහකයා තුළ කාලයක් තිස්සේ මුල් බැසගෙන, වැඩෙමින් පැවැති ආකල්පයන්, මතවාදයන්, මනෝභාවයන් මෙම මාධ්‍ය හරහා උද්දීපනය වීමක්, නැවත සක්‍රීය වීමක් සිදුවන බැවින් ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය ඍජුවම ග්‍රාහක ජනතාවට බලපෑම් කරන මාධ්‍යයක් බවට පත්ව ඇත.

ඉදිරිපත් කිරීමේ මාධ්‍ය හරහා වැඩි වශයෙන් ඍජුවම සම්බන්ධ වන්නේ විද්‍යුත් මාධ්‍ය කෙරෙහිය. නමුත් නියෝජනාත්මක මාධ්‍ය ලෙස ජනමාධ්‍ය සංකල්පයෙහි එන පොත්, සඟරා, පුවත්පත් ආදි මුද්‍රිත මාධ්‍ය තුළින් ද පොදුවේ සමාජය කෙරෙහිත් විවිධාකාරයෙන් බලපානු ලබයි. මෙහිදී මුද්‍රිත මාධ්‍ය වැඩි වශයෙන් ධනාත්මක ලෙස ළමා පරපුර කෙරෙහි බලපෑම් කරන බවක් දක්නට ලැබේ. විශේෂයෙන්ම අධ්‍යාපනය හදාරණ ළමුන් කෙරෙහි වැඩි වශයෙන් පොත්, පුවත්පත්, සඟරා බහුලව සමාජයෙහි දක්නට ලැබේ. එසේම තත්වයෙන් බාල, නිර්මාණශීලීත්වයෙන් පිරිහුණු, ළමා මනස පිළිබඳව කිසිඳු අවබෝධයක් නොමැති නව කතා, කෙටි කතා මෙන්ම විවිධ ග්‍රන්ථ ද දක්නට ලැබේ. නමුත් සාපේක්ෂ වශයෙන් ළමා මනසට කෙරෙන අහිතකර බලපෑම අඩුය. විජය පුවත් පත, මුතුහර, විජය පරිගණක වැනි අධ්‍යාපනික සඟරා මෙන්ම විවිධ අධ්‍යාපනික ග්‍රන්ථයන් ද ළමුන්ගේ අධ්‍යාපනික, සදාචාරාත්මක අභිවෘද්ධය සඳහා දායක වෙයි.

මුල් කාලීනව සමාජ පද්ධතියෙහි සංකල්පීය අදහස් වෙනස් කිරිමෙහිලා ප්‍රමුඛතම මාධ්‍ය බවට පත්වූයේ මුද්‍රිත මාධ්‍යය යි. නමුත් තාක්ෂණයේ දියුණුවත් සමඟ විද්‍යුත් මාධ්‍ය බිහි වූ හෙයින් වර්තමානයෙහි සමාජයට ප්‍රබල ලෙස බලපෑම් කරනු ලබන මාධ්‍ය විද්‍යුත් මාධ්‍ය බවට පත්ව ඇත. ඒ අතරිනුත් ගුවන් විදුලිය ශ්‍රව්‍ය මාධ්‍යයක් ලෙස බොහෝවිට සමාජයෙහි විනෝදාස්වාදය සපයන මාධ්‍යක් බවට පත්ව ඇත. නමුත් ගුවන් විදුලිය මඟින් ද සමාජයට මෙන්ම ළමා පරපුරට ද විශාල බලපෑමක් කරනු ලබයි. ගුවන් විදුලි මාධ්‍ය වර්තමානයෙහි කිසිඳු සදාචාරාත්මක භාවයකින් තොරව ක්‍රියාත්මක වන මාධ්‍යයක් ලෙස දක්වුවහොත් නිවැරදිය. හේතුව නම් වත්මනෙහි ක්‍රියාත්මක ගුවන් විදුලි නාලිකා අතුරෙන් බොහෝමයක් හරසුන්, අවිනීත භාෂා භාවිතයක් හරහා සමාජගත වී ඇති හෙයිනි. මෙම නාලිකා අමු අමුවේ භාෂාව විනාශ කරයි. ගුවන් විදුලියට සවන් දෙන්නටවත් නොහැකි අප්‍රිය සහගත භාෂා භාවිතයක් බොහෝ ගුවන් විදුලි නාලිකා තුළින් සම්ප්‍රේෂණය වේ. ළමා පරපුරෙහි ඉහ-මොළ කුණු කන්දල් වලින් පුරවන්නට, අවිනීත භාෂා භාවිතයක් ස්ථාපිත කරන්නට ගුවන් විදුලිය ඍජුව දායක වී ඇත. ළමුන්ගේ මුවඟ රැව්දෙන්නේ එදා ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයෙන්, ස්වදේශිය සේවයෙන්, රජරට සේවයෙන්, රුහුණු සේවයෙන් අසන්නට ලැබුණු

ISBN 978-955-4563-72-8

හරවත්, නැණවත්, ප්‍රිය ජනක, සරල සුගම වචන නොවේ. 'අරා ඇන්ඩ් පැස්බරා'ගේ අදෝනාවක් වැනි කුණු හරුප, අවකැපෙන වචන ය. පාසලට ගිය ද, ගෙදර සිටිය ද, කොතැනක සිටියත් දරුවන්ගේ මුවින් පිටවෙන්නේ, ඇසෙන්නේ 'පටිරෝල්' ය. එසේත් නැතිනම් 'පිසාචයා'ගේ වචනය. ගුවන් විදුලිය හරහා නින්දිත ලෙස දරුවන්ගේ මනස, භාෂාව, හැඳියාව, සදාචාරය විනාශ කර දමයි.

ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ, වර්තමානය වන විට ලොව සෑම රටකම අස්සක් මුල්ලක් නෑර සමාජයට, ජන ජීවිතයට සෘජුව බලපෑම් කළ හැකි ලෝකයේ ඉහළම හා ප්‍රබලම සන්නිවේදන මාධ්‍ය රූපවාහිනිය යි. මෙම සන්නිවේදන මාධ්‍ය හරහා සමස්ත ළමා සමාජය කෙරෙහිම බලපානු ලබන ආකාරය පිළිබඳව බටහිර විචාරකයින් නිතර නැගූ ප්‍රශ්න කිහිපයක් විය. එනම්, රූපවාහිය, ළමයින්ගේ දැනුම වැඩිකිරීමට බලපාන්නේද ? නැතහොත් දැනුම නොසලකා හැරීමට බලපාන්නේ ද ?, රූපවාහිනිය නිසා ළමයින්ගේ කියවීමේ රුචිකත්වය අඩු වෙමින් පවතින්නේ ද ?, ළමයින්ගේ පාසල් වැඩවලට ඇඟිලි ගැසීමක්, බලපෑමක් රූපවාහිනියෙන් සිදුකෙරේ ද ?, රූපවාහිනිය, ළමයින්ගේ රුචිකත්වය පහත් මට්ටමකට ගෙනයන්නේ ද ?, රූපවාහිනිය, ළමයින්ගේ සාරධර්ම විකෘති කරන්නේ ද ?, රූපවාහිනිය, ළමයින්ට ජීවිතය පිළිබඳව දත යුතු දේ කල් තබා කියාදෙන්නේ ද ? එය සුදුසු ද ?, රූපවාහිනිය, ළමයින් ස්වභාවිකත්වයෙන් ඈත්කර කෘතිම ලෝකයකට ඇබ්බැහි වූවන් බවට පත්කරන්නේද ? යනාදී ගැටලු පිළිබඳව නිතර පර්යේෂණ සිදු කරන්නට විය.

රූපවාහිනී මාධ්‍ය යනු පවුලේ සියලු දෙනාට එකට නැරඹිය හැකි මාධ්‍යයකි. මෙහිදී රූපවාහිනී මාධ්‍ය කුඩා ළමුන් වැඩි ආකර්ෂණයක් දක්වන මාධ්‍යක් ලෙස ජනමාධ්‍යයෙහි දක්නට ලැබේ. එම නිසාම රූපවාහිනිය ළමා පරපුරෙහි තීරණාත්මක සාධිස්ථානයක් ලෙස පෙන්වාදිය හැකිය. කවර හෝ මාධ්‍යයක් තුළින් ළමයා කෙරෙහි වන බලපෑම ආකාර තුනකින් දක්නට ලැබේ. හැසිරීම කෙරෙහි වන බලපෑම, ආකල්ප කෙරෙහි වන බලපෑම හා හැඟීම් කෙරෙහි වන බලපෑම යනුවෙන් එය පෙන්වා දිය හැකිය. මෙම බලපෑම් රූපවාහිය ඔස්සේ ධනාත්මකව ද, ඍණාත්මකව ද බලපානු ලබයි. රූපවාහිනියෙන් ළමයාට වන ධනාත්මක බලපෑම් අතර, 'දරුවාගේ අධ්‍යාපන මට්ටම ඉහළ යෑමට රුකුලක් වීම, ධනාත්මක ආකල්ප වර්ධනය, සමාජ දැනුම, අධ්‍යාපනික මෙවලමක් ලෙස ඇති සාර්ථක බව, සිරිත් විරිත්, සදාචාරාත්මක ගති ලක්ෂණ වලට යොමු වීම, විචක්ෂණශීලී වීම, වාර්තා, ගවේෂණාත්මක වැඩසටහන් මගින් ලෝකය පිළිබඳව, සමාජය පිළිබඳව, තාක්ෂණ විද්‍යාව පිළිබඳව දැනුම ඒකරාශී වීම'
ආදී කරුණු පෙන්වාදියහැකිය. මෙසේ ළමයා කෙරෙහි රූපවාහිනී මාධ්‍යයේ බලපෑම ධනාත්මක පරිකල්පනයක් තුළ විග්‍රහ කළ හැකි වුවද එය සර්ව සාධාරණ නොවේ. මෙසේ ක්‍රියාත්මක වන්නේ අතළොස්සක් වූ රූපවාහිනී නාලිකා පමණි. සමස්තයක් ලෙස ගත් කළ රූපවාහිනිය තුළින් ළමා පරපුරට වන හානිය බලපෑම අති විශාලය. රූපවාහිනී මාධ්‍ය මගින් විකාශනය කරනු ලබන වැඩසටහන් සම්බන්ධයෙන් ගොඩනැඟී ඇති විවිධාකාර මත අතුරෙන් වඩා ප්‍රබලම මතය වන්නේ වත්මන් රූපවාහිනී මාධ්‍ය මගින් ළමා පරපුරට අනන්‍ය වූ, ආවේණික වූ අවිහිංසකත්වය, සුන්දරත්වය ළමා ලොවින් ගිලිහී යන්නට ආරම්භ වී ඇති බවය. එම තත්වය උදාකරලීම වෙනුවෙන් රූපවාහිනී මාධ්‍ය සෘජු ලෙස වගකිව යුතු බවට ද චෝදනා එල්ල වෙමින් පවතී.

දරුවා යනු ස්වභාවයෙන්ම ප්‍රචණ්ඩකාරී අයෙකි. කෙමෙන් කෙමෙන් දරුවා වැඩිවියට පත් වෙද්දී ඔහු තුළ වූ ප්‍රචණ්ඩත්වය යටපත් වේ. නමුත් ජීවවිද්‍යාත්මකව සලකා බලන කල්හි ක්‍රමයෙන් යටපත් වන දරුවාගේ ප්‍රචණ්ඩත්වයට නැවත පණ පෙවීමක් රූපවාහිනිය මගින් සිදු කෙරේ. වර්තමානයෙහි බොහෝ ළමා වැඩසටහන් නිර්මාණය වන්නේ වැඩිහිටියන්ගේ දෘෂ්ටි කෝණයෙනි. එම වැඩසටහන්හි අන්තර්ගතයන් දරුවාට ග්‍රහණය කරගැනීමට ඉතා අපහසුය. එසේම බොහෝ වැඩසටහන් දරුවන්ට යෝග්‍ය තත්වයක නොමැති බවක් ද දක්නට ලැබේ. මෙවැනි අහිතකර වැඩසටහන් නිසා ළමයින්ට වන හානිය අසීමිතය. රූපවාහිනී මාධ්‍ය තුළින් ළමුන්හට සිදුවන බලපෑම් විවිධාකාරයෙන් දක්නට ලැබේ.ඒ අතර, රූපවාහිනිය ළමයින් කායික හා මානසික වශයෙන් අක්‍රිය කරයි, රූපවාහිනය ළමයින්ගේ මානසික ඒකාග්‍රතාවය බිඳ දමයි, ළමයින්ගේ පරිකල්පන ශක්තිය හීන කරයි, ළමයින් තුළ කලහකාරී බව වර්ධනය කරයි, ළමයා සමාජය තුළ හුදෙකලා බවට පත් කරයි, රූපවාහිනිය ළමයා අකාලයේ පරිණත කරයි, බාහිර සම්බන්ධතාවන්ගෙන් තොරවීම නිසා අවට ලෝකය පිළිබඳව බිය වේ, අන් අයගේ දුක වේදනාව පිළිබඳව සංවේදී නොවේ, ළමයින් කළහකාරී ලෙස අන් අය ඉදිරියේ හැසිරීමට වැඩි කැමැත්තක් දක්වයි, ළමයින්ගේ සදාචාරාත්මක සංවර්ධනය අඩාල කරයි, ළමයින්ගේ පෞරුෂත්වය හීන කරයි, යනාදී ගැටලු රාශියකට රූපවාහිනිය ඔස්සේ වත්මන් ළමා පරපුර මුහුණ පා ඇත.

***ISBN 978-955-4563-72-8***

රූපවාහිනී මාධ්‍ය තුළින් ළමයාගේ ජීවිතය කෙරෙහි ආධ්‍යාත්මික හා භෞතික වශයෙන් හැඟීම්, ආකල්ප, හැසිරීම් ආදිය කෙරෙහි විශේෂ වශයෙන් බලපෑම් කරණු ලබයි. විශේෂයෙන්ම වර්තමාන රූපවාහිනී වැඩසටහන් මඟින් ළමයා අකාලයේ වැඩිහිටියෙකු බවට පත්වන ආකාරයක් ද දක්නට ලැබේ. ළමා කාලය යනු සමාජය පිළිබඳව, ලෝකය පිළිබඳව ඉගෙන ගන්නා කාලයයි. දෙමාපියන්ගෙන්, වැඩිහිටියන්ගෙන්, ගුරුවරුන්ගෙන්, පොදුවේ මුළු මහත් සමාජයෙන්ම ළමයා ඉගෙනීම සිදුකරනු ලබයි. තමන් සතු දක්ෂතා, ආකල්ප, අගයන් ගොඩනගා ගැනීමට ළමා කාලය තුළ නිරන්තරයෙන් කැප වේ. මේ සඳහා ළමයා ශ්‍රව්‍ය - දෘශ්‍ය සියලු මාධ්‍ය හරහා තොරතුරු එක්රැස් කිරීම කරනු ලබයි. රූපවාහිය ළමයාට ඉතා සමීපතම තොරතුරු සපයන මාධ්‍ය වූ විට සමාජය පිළිබඳව, ලෝකය පිළිබඳව හා පුද්ගලයා පිළිබඳවත්, ක්‍රියාකාරීත්වය පිළිබඳවත් තේරුම් ගැනීමට සැබෑ ජීවිතය තුළදී මෙන්ම, රූපවාහිනියෙන් ලබා ගන්නා අත්දැකීම් තුළින් ද චිත්‍රයක් මනස තුළ මවා ගනී. ළමයා වැඩිපුර රූපවාහිනිය නැරඹීමෙන් වැඩිපුර තොරතුරු ප්‍රමාණයක් ද ඒකරාශී කරගනු ලබයි. මෙයින් පැහැදිලි වන්නේ රූපවාහිය මඟින් අති ප්‍රබල බලපෑමක් ළමයාගේ කායික හා මානසික දියුණුවට සිදුකරන බවකි. එය යහපත් හෝ අයහපත් බලපෑමක් විය හැකිය. එය තීරණය වන්නේ ළමයා නරඹන රූපවාහිනී වැඩසටහන් වලට පදනම්වය.

රූපවාහිනී මාධ්‍ය මෙන්ම පොදුවේ ජනමාධ්‍ය මඟින් ඉදිරිපත් කෙරෙන විවිධාකාර වූ විනෝදාස්වාද වැඩසටහන් මඟින් ප්‍රචණ්ඩත්වය බහුලව දැකිය හැකි බව තවත් මතයකි. එහිදී හැඟීම් උද්දීපනය, අසංවේදීතාව, විරේචනය හා ව්‍යාප්ත කිරීම ආදි ක්‍රම හේතුවෙන් ළමයා හා මාධ්‍ය අතර සිදුවන ගනුදෙනුවේදී ළමා මනසට හා චර්යාවන්ට ප්‍රබල බලපෑමක් සිදුවන බවක් දක්නට ලැබේ. විශේෂයෙන්ම කාටූන්, චිත්‍රපට, ටෙලි නාට්‍ය ආදියෙහි වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ සමාජ ප්‍රචණ්ඩත්වයන්, මිනී මැරුම්, පහරදීම්, ස්ත්‍රී දූෂණ, කාන්තා නග්න රූප ආදී දර්ශනයන් ය. මෙයින් ළමයාගේ මානසික ඒකාග්‍රතාවය මෙන්ම සදාචාරය ද බිඳ වැටී ප්‍රචණ්ඩකාරී, නොරිස්සුම් සහගත තත්වයකට දරුවන් යොමු කරනු ලබයි. මාධ්‍ය හැසිරීම් විෂයෙහි හඳුනාගත හැකි තවත් අතිශය වැදගත් බලපෑමක් ලෙස ළමයාගේ සෞඛ්‍ය කෙරෙහි සිදුවන බලපෑම පෙන්වාදිය හැකිය. දුම්පානය, මත්ද්‍රව්‍ය හා මත්කුඩු පානය කිරිම් ආදී දර්ශන මඟින් ඒවාට ඇබ්බැහි වීමේ ප්‍රවණතාවය ළමා පරපුර අතර ඉහළ ගොස් ඇති බව වත්මන් සමාජයෙහි දක්නට ලැබේ. එසේම ළමයාගේ ආහාර ගැනීමේ ක්‍රියාවලිය කෙරෙහි මාධ්‍ය වැඩසටහන් ඍජුවම බලපා ඇත. ක්ෂණික ආහාර දැන්වීම් නිසා ළමයින් අතර දියවැඩියාව, මන්දපෝෂණය හා අධික තරබාරුකම සීඝ්‍රයෙන් ව්‍යාප්තව ඇත. විශේෂයෙන්ම ග්‍රාමීය ළමයින්ට වඩා නාගරික මධ්‍යම පාන්තික දරුවන් මෙම තත්වයට ගොදුරු වීමේ වැඩි ප්‍රවණතාවක් පෙන්නුම් කොට ඇත. මධ්‍යම පාන්තික දෙමාපියන් පහසු ජීවන රටාවට හුරුවීමේ ප්‍රතිඵලයක් ලෙස මාධ්‍ය මඟින් උලුප්පා දෙන සෑම ක්ෂණික ආහාරයක්ම සිය දරුවාට නිතැතින්ම ලබා දීමට උත්සුක වේ. මෙම ක්ෂණික ආහාර රටාව නිසා වත්මන් ළමා පරපුරට තරබාරුකම, මන්දපෝෂණය හා දියවැඩියාව උරුමව ඇත. මෙය ඍජුවම ජනමාධ්‍යයේ බලපෑම මත සිදු වන්නක් බව නොරහසකි.

මීට අමතරව ළමයා හා පවුල අතර පවතින සහසම්බන්ධතාවය ද, දරුවා පවුලේ සාමාජිකයන්ගෙන්, සිය සහෝදරයන්ගෙන් ඈත් වී හුදෙකලා තත්වයකට පත්වන අතර එය දරුවාගේ මානසික සෞඛ්‍යයට එතරම් සුබවාදී නොවේ. අධ්‍යාපනයට, බාහිර ක්‍රියාකාරකම් වලට හා ළමයාගේ නින්දට ප්‍රබල ලෙස මේ හේතුවෙන් බලපෑම් එල්ල විය හැකිය. දරුවාගේ අලස බවට මෙය බෙහෙවින් බලපාන අතර එය දරුවාගේ මන්ද මානසිකත්වයට ද හේතුවක් විය හැකිය. කෙසේ වෙතත් මාධ්‍ය තුළින් අත්වන ඵලදායී බලපෑම් ද නැතුවාම නොවේ. ළමයා නව සමාජයක්, නව පෞරුෂයක් සහ නව ලෝකයක් පිළිබඳ ආකල්පයන් ගොඩනැඟීමට, හැසිරවීමට හැකි බලයක් ජනමාධ්‍ය සතු වේ. ශාරීරික වශයෙන් ද, ඉන්ද්‍රීය වර්ධනය, හැඟීම් සංවර්ධනය, සමාජ අවබෝධය, සමාජ සම්බන්ධතා හා භාෂා සංවර්ධනය කෙරෙහි යහපත් ආකල්ප හා චර්යාවන් ගොඩනැඟීමට ජනමාධ්‍ය ක්ෂේත්‍රයට ප්‍රබල හැකියාවක් පවතී.
මෙම සියලු කාරණා පිළිබඳ සැලකීමේ දී ජනමාධ්‍ය භාවිතා කිරිම සමාජ තරාතිරම, සමාජ පන්තිය, වර්ගය, වයස යන සීමාවන්ගෙන් තොරව සිදු කළ හැකි බව පැහැදිලිව පෙනෙන කරුණකි. එසේම මෙම ජනමාධ්‍ය තුළින් ළමා පරපුරට ඍජුවම බලපෑමක් කළ හැකි බවද සත්‍යයකි. එය යහපත් හෝ අයහපත් තත්වයක් මත ගොඩනැඟෙන්නේ ජනමාධ්‍ය භාවිතා කරනු ලබන ආකාරය අනුවය. මෙහිදී ජනමාධ්‍යයෙහි වගකීම වන්නේ දරුවන්ට හොඳම දේ මාධ්‍ය තුළින් දායාද කිරීමයි. එසේම දෙමාපියන් විසින් ළමුන්ගේ මූලික අවශ්‍යතාවයන් නිවැරදිව අවබෝධ කොට ගෙන දරුවන් නිවැරදි දිශාවට යොමු කිරීමට උත්සුක වීම අනිවාර්ය සාධකයකි. නැතහොත් වර්තමාන ජනමාධ්‍යයෙහි හැසිරිම පිළිබඳව සැලකීමේදී ළමා පරපුරට අත්වන්නේ ශෝචනීය ඉරණමක් බව නොකිව මනාය.

***ISBN 978-955-4563-72-8***

## නිගමනය

ලොව පවතින සෑම සමාජ විද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක නිර්ණායකයක් තුළින්ම සනාථ කර ඇති ආකාරයට ළමයා යනු, ඉතා සුරක්ෂිතව රැකබලා ගත යුතු, වැඩි අවධානයක් යොමු කළ යුතු සමාජීය ඒකකයකි. ළමයා සෑමවිටම සමාජානුයෝජනය වීමේදී බාහිරෙන් ලැබෙන ආරම්මණයන් ඔස්සේ ස්වකීය ක්‍රියාකලාපයන් ද ගොඩනගා ගන්නා හෙයින් ද, ඉතා සියුම් ලෙස සමාජය හා පුද්ගල ක්‍රියාකාරීත්වය දෙස විපරම් සහගතව පසුවන බැවින් ද, ළමා කාලය යනු ඉතා සුවිශේෂී කාලපරිච්ඡේදයකි. වර්තමාන සමාජ ක්‍රියාකාරීත්වයේදී ඉතා අඩු වශයෙන් සැලකිල්ලක් හා අවධානයක් යොමු වන අංශයක් බවට ළමා අවධිය පෙන්වා දිය හැකිය. මෙහිදී පවුලේ සාමාජිකයන්ගෙන් ද, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේදී ද දරුවා පිළිබඳව යොමුවන අවධානය වර්තමානය වන විට ගිලිහෙමින් පවතී. සමාජ සදාචාරය අනාගතය වෙනුවෙන් ගොඩනැගීමට නම් වර්තමානයෙහිදී ළමා පරපුරෙහි නිසි වර්ධනය අත්‍යවශ්‍යම කටයුත්තකි. එය අධ්‍යාපන, සමාජීය, සදාචාරාත්මක ආදී වශයෙන් සෑම අංශයකින්ම ගොඩනැගීම ඉතා වැදගත්ය. ළමයා පිළිබඳව මනෝවිශ්ලේෂණවාදයේදී දක්වන ආකාරයට සෑමවිටම සමාජය කෙරෙහි සක්‍රීය ලෙස බැඳී පවතින චරිතයක් ලෙස පෙන්වා දෙයි. එය මව් කුස තුළදීම මානවයාට සහජත්වයෙන් ලැබෙන දෙයකි. සමාජය පිළිබඳව, බාහිර පරිසරය පිළිබඳව කුතුහලයෙන් වෙසෙන්නෙකු ලෙස ළමයා හඳුන්වා ඇත. එබැවින් උත්පත්තියේ සිටම දරුවා යහපත්, සදාචාරවත් ආරම්මණයන්ගෙන් පෝෂණය වීම 'ළමයා' ළමයෙකු වශයෙන් හඳුනා ගැනීමට උපකාරී වේ. නූතන සමාජ ක්‍රියාකාරීත්වය තුළින් ළමයින්හට විවිධ හිතකර මෙන්ම අහිතකර බලපෑම් ද ඍජුව එල්ලවනවාසේම සමාජයෙහි විවිධ සජීවී ක්‍රියාකාරී අංශයන්ගෙන්ද විවිධ බලපෑම් එල්ල වේ. එහිදී ප්‍රධාන වශයෙන් ළමා පරපුර කෙරෙහි බලපෑමක් එල්ල වන අංශයක් ලෙස ජනමාධ්‍ය පෙන්වාදිය හැකිය. ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය වර්තමානයෙහි සෑම සමාජ ඒකකයක් කෙරෙහිම ඉතා සීඝ්‍රයෙන් ව්‍යාප්තව ඇති හෙයින් එහි ද බලපෑම නොයෙක් ආකාරයෙන් ළමා පරපුර කෙරෙහි බලපෑම් සිදු කරන ආකාරයක් ඒ පිළිබඳ ඉහත විමසීම් වලින් තහවුරු වේ. එම බලපෑම හිතකර ලෙස ද, අහිතකර ලෙස ද බලපැවැත්වෙන අතර හිතකර භාවිතය කෙමෙන් ජනමාධයයෙන් ගිලිහී යන ආකාරයක් ද දක්නට ලැබේ. ගෝලීය ආර්ථික රටාවකට යොමු වෙමින් පවතින සෑම සමාජයකම මෙම ගැටලුව දක්නට ලැබේ. වැඩිහිටියන්ගේ කාර්ය බහුලත්වය, නිදහස අවම වීම තුළින් ළමයාගේ වගකීම් දෙමාපියන් ඇතුළු සමස්ත පවුල් පරිසරය තුළින්ම ගිලිහෙන අතර එය ළමයාගේ සංවර්ධනය කෙරෙහි බෙහෙවින් බලපානු ලබයි.

## ආශ්‍රිත ග්‍රන්ථ

ඇතුගල, ආරියරත්න. (2005), රූපවාහිනිය සන්නිවේදනය, රත්න ප්‍රකාශකයෝ, කොළඹ 10.
අතුකෝරල, දයා රෝහණ. අතුකෝරල, හේලි නිමලා. (2003) , ළමා මනෝවිද්‍යාව හා ළමා සංවර්ධනය, සංවර්ධන මනෝවිද්‍යා චින්තන අධ්‍යයන ආයතනය, අංක 60/2, කොටා පාර, බොරැල්ල, කොළඹ 08.
කරුණානායක, නන්දන. (2004), සන්නිවේදනයට නව ප්‍රවේශයක්, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.
නිශ්ශංක, චන්දිම. (2004), ජනමාධ්‍ය ප්‍රචණ්ඩත්වය හා ළමා අයිතිවාසිකම්, ඇස්. ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ 10.
ජිනදාස, මනෝජ් පුෂ්පකුමාර. (2014), භාෂාව හා සන්නිවේදනය, ජයවි ප්‍රින්ටස්, කඩවත.
පෙරේරා, ඥානදාස. (2004), ළමාවිය සහ මනෝවිද්‍යාව, සහශ්‍ර ප්‍රකාශකයෝ, මාලිගාකන්ද පාර, කොළඹ 10.
හපුආරච්චි, ගාමිණී. (සෑම ළමයෙක්ම බුද්ධිමතෙකි) පියතිස්ස ජානකී.(මත්පැන් හා ළමා අපචාර), (4 වෙනි කාණ්ඩයේ 3 වෙනි කලාපය, 2003 ඔක්තෝම්බර් - නොවැම්බර්), මනෝවිද්‍යා, මනෝවිද්‍යා අධ්‍යයන ආයතනයේ සංස්කරණයකි.
චන්ද්‍රසේන, දිල්හානි.(ළමා මනෝවිද්‍යාව හා ළමයින් දරුකමට හදා ගැනීම) (4 වෙනි කාණ්ඩයේ, 1 වෙනි කලාපය, 2003 ජනවාරි - මාර්තු), මනෝවිද්‍යාව, මනෝවිද්‍යා අධ්‍යයන ආයතනයේ සංස්කරණයකි.
දිල්හානි, චන්ද්‍රසේන.(භාෂාව චින්තනය හා ළමා සංවර්ධනය) (4 වෙනි කාණ්ඩයේ 2 වෙනි කලාපය, 2003 ජූලි - සැප්තැම්බර්), මනෝවිද්‍යාව, මනෝවිද්‍යා අධ්‍යයන ආයතනයේ සංස්කරණයකි.